# කොවිඩ් 19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. COVID-19 සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

MINISTRY OF HEALTH AND INDIGENOUS MEDICAL SERVICES

World Health Organization

GOVERNMENT MEDICAL OFFICERS ASSOCIATION

SRI JAYAWARDENEPURA KOTTE MUNICIPAL COUNCIL

## 36.විවෘත වෙළඳපොල

ගමේ පොළවල් සහ ආර්ථික මධ්‍යස්ථාන අවසර දී ඇති විට ඒවායේ කටයුතු ආරම්භ කරනු ඇත. පහත දැක්වෙන මග පෙන්වීම මෙම කාර්යයන් ආරක්ෂිතව සිදු කිරීම සඳහා සහාය වනු ඇත. වෙළෙන්දන්ගේ සංඛ්‍යාව අඩු කිරීම සඳහා ගමේ පොළවල් ක්‍රියාත්මක වන සතියේ දින ගණන වැඩි කිරීම කල හැක.

1. **වෙළඳපොල පරිශ්‍රයේ අවශ්‍ය පහසුකම් ඇති බව සහතික වන්න:**
   - විවිධ ස්ථානවල අත් සේදීමේ පහසුකම් ප්‍රමාණවත් තරම් ජල සැපයුම් සහ සබන් සපයා ඇති බවට.
   - පරිශ්‍රයේ පොදු වැසිකිළි තිබේ නම් ඒවා පිරිසිදු කර විෂබීජහරණය කර ඇති බවට සහතික විය යුතු අතර අත් සේදීමේ පහසුකම් සහ සබන් ඇති බවට.
   - ස්ථානයට පැහැදිලි පිවිසුමක් සහ පිටවීමක් ලකුණු කරන්න. වෙළඳපල ප්‍රදේශය විශාල නම්, ස්ථානය උප ප්‍රදේශවලට බෙදා එක් එක් ප්‍රදේශය සඳහා පිවිසුම් හා පිටවීම් නම් කරන්න.
   - අවම වශයෙන් මීටර 1 ක ශාරීරික දුරස්ථභාවයකින් යුතුව ගමන් කිරීමට හා ඉඩ දීම සඳහා වෙළෙන්දන් අතර ප්‍රමාණවත් දුරක් ඇති බවට සහතික වන්න.



   - පරිශ්‍රය තුළ වාතාශ්‍රය හොඳින් ලැබෙන බව තහවුරු කරන්න. වහල සහිත හෝ විවෘත වෙළඳපොලවල් ඉඩකඩ සහිත විය යුතුය. ගෘහස්ථ වෙලඳපොලවල් වල වාතය හොඳින් ලැබීම සහ වාතය හොඳින් ගලායාම පහසු කිරීම සඳහා කවුළු විවෘත කළ යුතුය.
   - උණ / ශ්වසන රෝග ලක්ෂණ ඇති පුද්ගලයින් වෙළඳපොළට යාමෙන් වැළකී සිටිය යුතු බවට සන්නිවේදනය කිරීමේ පොදු සංඥාවක් අනුගමනය කළ යුතුය.
   - වෙළඳපල / මධ්‍යස්ථානයේ තදබදය අඩු කිරීම සඳහා, පිවිසුම් දොරටුවෙන් නියමිත වේලාවට ඇතුළු වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව කළමනාකරණය කිරීම සහ ශාරීරික දුරස්ථභාවය සහිත පෝලිම් සඳහා දොරටුව අසල පහසුකම් සැපයීම.
   - දිනපතා කසළ ඉවත් කිරීමට පහසුකම් සපයන්න. (මුද්‍රා තැබූ බඳුන් ප්‍රවාහනය වඩාත් සුදුසුය).

2. **පැටවුම් සහ බෑමේ ස්ථානය කළමනාකරණය කරන්න (මූලික වශයෙන් ආර්ථික මධ්‍යස්ථාන සඳහා අදාළ වේ).**
   - පැටවීම සහ බෑම සඳහා ඇතුළු වන වාහන සඳහා නිශ්චිත වේලාවක් සහ පිවිසුමක් නියම කරන්න.

3. **දිනක සෙනග අඩු කිරීම සඳහා වෙළඳපොළ පැවැත්වෙන දින ගණන දෙගුණ කරන්න. උදා: සෙනසුරාදා දින පවත්වන වෙළඳපොළක් සෙනසුරාදා සහ ඉරිදා දිනවල පැවැත්විය හැකිය**

4. **වෙළෙන්දන්ගේ ආරක්ෂාව සහතික කිරීම**
   - මුහුණු ආවරණ නිසි ලෙස පැළඳීමට සියලුම වෙළෙන්දන්ට දන්වන්න
   - පෝස්ටර්, බැනර්, පොදු ප්‍රදර්ශන තිර හෝ මධ්‍යස්ථානයේ / වෙළඳපොලේ ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරමින් වෛරසය පැතිරෙන ආකාරය සහ වැළැක්වීමේ පියවර 7 පිළිබඳව වෙළෙන්දන් දැනුවත් කරන්න.
   - සෑම විටම ගනුදෙනුකරුවන්ගෙන් මීටර් 1 ක දුරක් පවත්වා ගැනීමට වෙළෙන්දන්ට උපදෙස් දෙන්න.

- මුදල් ගණු දෙනු කිරීමේදී ප්‍රවේශම් වන්නැයි සහ හැකි සෑම විටම අත විෂබීජහරණය කරන ලෙස වෙළෙන්දන්ට උපදෙස් දෙන්න.
- ආහාර පරිභෝජනය සඳහා ආහාර පාන වර්ග හෝ භාජන බෙදා නොගන්නා ලෙස වෙළෙන්දන්ට දන්වන්න.
- අසනීප නම් (උණ, කැස්ස, උගුරේ අමාරුව වැනි) සියළුම වෙළෙන්දන්ට සහ සේවකයින්ට නිවසේ රැඳී සිටින ලෙස දැනුම් දෙන්න.
- වෙළඳපොළෙන් ආපසු නිවසට පැමිණි පසු ආරක්ෂිතව ක්‍රියා මාර්ග ගැනීම සඳහා වෙළෙන්දන්ට උපදෙස් ලබා දෙන්න.
  I. නිවසට ඇතුළු වීමට පෙර පාවහන් ඉවත් කරන්න.
  II. ඇතුල් වීමට පෙර අත්, මුහුණ සහ පාද සබන් යොදා සෝදන්න.
  III. පැළඳ සිටින ඇඳුම් වෙන වෙනම සෝදන්න.

5. ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව සහතික කරන්න.

- සියලුම ගනුදෙනුකරුවන් මුහුණු ආවරණ නිසි ලෙස පැළඳිය යුතුය.
- වෙළඳපොළට ඇතුළුවීමට අවසර ඇත්තේ නම් කරන ලද පිවිසුමෙන් පමණි.
- වෙළඳපොලේ සිටින වෙනත් පුද්ගලයින් සහ වෙළෙන්දන් අතර සෑම විටම මීටර් 1 ක ආරක්ෂිත ශාරීරික දුරස්ථභාවයක් පවත්වා ගත යුතුය.
- පොදු පෘෂ්ඨයන්/මතුපිටවල් හා මුදල් ස්පර්ශයෙන් පසු ඔබේ මුහුණ ස්පර්ශ කිරීමෙන්වැළකිය යුතුය.
- වෙළඳපොළට ඇතුළු වීමට පෙර සහ පිටවන විට ඔබේ දැත් සේදිය යුතුය.
- වෙළඳපොළෙන් ආපසු නිවසට පැමිණි පසු මහජනතාව ගත යුතු ආරක්ෂිත පියවරයන් ප්‍රදර්ශනය කරන්න:
  I. නිවසට ඇතුළු වීමට පෙර පාවහන් ඉවත් කිරීම.
  II. ඇතුල් වීමට පෙර අත්, මුහුණ සහ පාද සබන් යොදා සේදීම.
  III. පැළඳ සිටින ඇඳුම් වෙන වෙනම සේදීම.

6. ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම හිමිකරු වගකීම වේ.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- පොදු සංඥා පුවරු භාවිතා කළ හැකිය.
- සියළුම වෙළෙන්දන්ට පත්‍රිකාවක් දීම.
- ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරමින් ආරක්ෂිත පියවරයන් පිළිබඳ නිතර දැනුවත් කරන්න.



සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.